# A Study of Notion on Free Will towards the Social Concepts With Reference To Pali Canon

සමාජ ආකල්ප විෂයෙහි බුදුසමය දක්වන ස්වච්ඡන්දතාව පිළිබඳ මූලාශ්‍රයාගත අධ්‍යයනයක්

Karapikkada Sobitha

“ස්වච්ඡන්දතාව” යනු පුද්ගල කැමැත්ත හෙවත් ස්ව ආකල්පයන්ට අනුව ක්‍රියා කිරීමයි. ආදි බුදුසමය දෙස විමසීමේ දී ද එහි පුද්ගල අධිකාරීවය නිරන්තරයෙන් අවධාරණය කරන අයුරු දැකගත හැක. විශේෂයෙන් සමාජ ආකල්ප විශයෙහි පමණක් නොව, ආගමික පසුබිම තුළ ද බුදුසමය තුළ දක්නට ඇත්තේ පුද්ගල ස්වච්ඡන්දතාවයි. මෙම පුද්ගල නිදහස අන්‍ය කිසිදු ආගමික ඉගැන්වීමක හෝ ඒ හා බැඳුණු සමාජ පසුබිමක් තුළ දක්නට නොලැබෙන්නකි. ආදි බෞද්ධ ඉගැන්වීම් වලට අනුව සෑම පුද්ගල ක්‍රියාවක් විෂයෙහිම ආධිපත්‍ය උසුලනුයේ මනස හෙවත් සිතය. මනස යනු බාහිර බලවේගයක අධිකාරීත්වයකට කිසිවිටෙක යටත් නොවන ධර්මතාවයකි. එසේම සිත පාලනය වනුයේ පුද්ගල ස්වච්ඡන්දතාවය මතය. එබැවින් සමාජ ආකල්ප ක්‍රියාත්මක විය යුත්තේ ද පුද්ගල ස්වච්ඡන්දතාවය මතය. මෙසේ සමාජ ආකල්පයන් පුද්ගල ස්වච්ඡනදතාවය මත ක්‍රියාත්මක වීම තුළ බුදුසමය පෙන්වාදෙන සුවිශේෂ ඉගැන්වීමක් වේ. එනම් සියලු පුද්ගල ක්‍රියා විෂයෙහි පුද්ගලයාට බැඳීමක් හා වගකීමක් පැවරීමයි. ඒ තුළ බුදුසමය පෙන්වාදෙන කර්ම විපාක විඳීමට ද පුද්ගලයාට සිදු වේ. අන්‍ය ආගමික ඉගැන්වීම් අනුව පුද්ගල ක්‍රියාවන්හි ආධිපත්‍ය බාහිර බලවේගයක ආධිපත්‍යයට යටත්වේනම්, එම ක්‍රියාවන්ගේ වගකීම පුද්ගලයා වෙත පැවරිය නොහැක. ඒ තුළ පුද්ගල මෙන්ම සමාජ යහ පැවැත්ම අවධාරණය කළ නොහැක. ම.නි. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයට අනුව සෑම ක්‍රියාවක් කිරීමට පළමුව එම ක්‍රියාව පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය කළ යුතුය. එය ද ක්‍රමවේද හතරක් පදනම් කොටගෙන සිදුකළ යුතු බව දැක්වේ. එසේම අං.නි. අධිපතෙය්‍ය සූත්‍රයෙහි පුද්ගල ක්‍රියාවක් සිදුකිරීමේ දී අධිපති ධර්ම තුනක් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය කළයුතු බව දක්වා ඇති අතර, මෙයින් ප්‍රමුඛතාවය හිමිවනුයේ අත්තාධිපතෙය්‍ය ධර්මතාවයට හෙවත් තමා ප්‍රධාන කොට ගැනීමටයි. පුද්ගලයාට ලෝකය රැවටීමට පත්කළ හැකි නමුදු තම සිත කිසිවිටෙක රැවටීමට නොහැක. ඒ අනුව කටයුතු කිරීම අත්තාධිපකෙය්‍ය ධර්මය තුළින් සිදු වේ. ආගමික පසුබිම පිළිබඳ විමසීමේ දී ද අන් කිසිදු ආගමක නොදැක්වෙන ස්වච්ඡන්දතාවයක් බුදුසමයෙහි දැක්වේ. අං.නි. කාලාම සූත්‍රය තුළ එන කරුණු අධ්‍යයනයෙන් එය මනාව පැහැදිලි වේ. මීට අමතරව පුද්ගලයාගේ ස්වච්ඡනදතාවය මත සිදුකරන්නා වූ සියලු ක්‍රියාවන් නිවැරදි ආකාරයකට සිදුකොට එහි නිසි ප්‍රතිඵල ලබාගැනීමේ ක්‍රමවේදයක් ද බුදුසමය තුළ වේ. එනම් ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යන ක්‍රමවේදයන් ඔස්සේ කටයුතු කිරීමයි. මේ තුළින් නියතිවාදි, පුබ්බේකතහේතුවාදි, දේවවාදි, අහේතුකවාදි, අධිච්ඡසමුප්පන්නවාදි වැනි ඉගැන්වීම් රාශියක් ද ප්‍රතික්ෂෙප වේ. මෙසේ ආදි බුදුසමය තුළ පුද්ගල ස්වච්ඡන්දතාවය අවධාරණය කළ ද සමාජයේ මෙන්ම පුද්ගලයාගේ ප්‍රගතිය විෂයෙහි එහි අගය කිරීමට ලක්කරනුයේ ස්වච්ඡන්දතාවයට අනුව කටයුතු කිරීම නොව ක්‍රියාවන් අතුරෙන් උසස් වූ, නිවැරදි වූ යෝග්‍ය වූ, ක්‍රියාව තෝරා එය

සිදුකිරීමයි. මෙම පත්‍රිකාව තුළින් උක්ත කාරණා පිළිබඳ මූලාශ්‍රයගත තොරතුරු නයින් අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පදඃ ස්වච්ඡන්දතාව, සමාජ ආකල්ප, අධිකාරීත්වය, බාහිර බලවේග, වගකීම

***Keywords: free-will, social concepts, authority, external forces, responsibility***